# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2018

# தேசிய கல்வி ஆணைக்குழு

## வருடாந்த அறிக்கை

2018

# National Education Commission

## Annual Report

2018

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda

| පටුන | | | පිටු අංකය |
|---|---|---|---|
| 1. | හැඳින්වීම | | 2 |
| 2. | කාර්යයන් හා කර්තව්‍යයන් | | 4 |
| 3. | කොමිෂන් සභාවේ සංයුතිය | | 5 |
| 4. | ඉලක්ක හා කාර්ය සාධන දර්ශක | | 6 |
| 5. | කාර්ය සාධන සාරාංශය - 2018 | | 7 |
| 6. | අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2018 | | 14 |
| 7. | ඇමුණුම් | | |
| | ඇමුණුම I | - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2018 | 15 |
| | ඇමුණුම II | - මූල්‍ය ප්‍රකාශය - 2018 | 16 |
| | ඇමුණුම III | - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු | 17 |
| | ඇමුණුම IV | - විගණකාධිපති වාර්තාව - 2018 | 18 |
| | ඇමුණුම V | - ආයතනික ව්‍යුහය | 26 |

## හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

මෙහි පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තෝම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් අවසන් වන තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තෝම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව 2012 නොවැම්බර් 20 සිට 2017 අප්‍රේල් 28 දින දක්වා ක්‍රියාත්මක විය. 7වන කොමිෂන් සභාවේ සාමාජිකයන් 2017 සැප්තැම්බර් 7 වන දින අතිගරු ජනාධිපතිතුමා පත්කර ඇත. එහි ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2017 ඔක්තෝම්බර් 19 වන දින පවත්වන ලදී.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවූත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවූත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම.

**මෙහෙවර**

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවූත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවූත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සංයුතිය

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 31දෙනෙකුගෙන් සමන්විතය.

## ඉලක්ක හා කාර්ය සාධන දර්ශක - 2018

| ක්‍රියාකාරකම | | අරමුණු | කාර්ය සාධන දර්ශක |
|---|---|---|---|
| 01 | පාසල් පද්ධතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ පවතින ගැටළු සඳහා විසඳුම් ලබා දීම පිණිස ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම. | ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්තියක් පැවතීම. |
| 02 | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | ශ්‍රී ලංකාවේ පෙර පාසැල්වල අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීම. | ශ්‍රී ලංකාවේ පෙර පාසැල්වල අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තියක් සැකසීම. |
| 03 | STEM Education පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීමට දායක වීම. | ශ්‍රී ලංකාවේ පාසැල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා දායකත්වය ලබා දීම. | STEM Education පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදීම. |
| 04 | උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය | උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුනාගෙන ඒ සඳහා වඩාත් ඵලදායී දිශානතීන් අනුව ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීම. | උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සැකසීම. |
| 05 | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය සැකසීම | වැඩ ලෝකයේ අවශ්‍යතාවයන් සහතික කිරීම පිණිස දැනට පවතින ප්‍රතිපත්තිය සමාලෝචනය හා නව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ නව ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.. |
| 06 | සිංහල අක්ෂර ලේඛන හා භාෂා ප්‍රයෝග විධි හා ප්‍රමිතීන් පිළිබඳ නිර්දේශ ලබාදීම. | සිංහල අක්ෂරයන්හි පැවතිය යුතු ප්‍රමිතීන් පිළිබඳව අධ්‍යයනය කර නිර්දේශ ලබාදීම. | නිර්දේශ සහිත වාර්තාවක් සකස් කිරීම. |

## කාර්ය සාධනය සාරාංශය - 2018

### හැදින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර තුනක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු තුනක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.

සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2018 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

**1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය.**

**1.1 වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය සඳහා ඉදිරිපත් කරන ලද තාක්ෂණ විෂය මාලාව පිළිබඳ දැනුවත් කිරීම.**

වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය සඳහා අළුතින් හඳුන්වා දුන් තාක්ෂණ විෂය මාලාව පිළිබඳව සාමාන්‍ය අධ්‍යාපනය පිළිබද ස්ථාවර කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම උදෙසා ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් සමඟ 2018.01.17 දින ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පරිශ්‍රයේදී සාකච්ඡාවක් පවත්වන ලදී.

**1.2 පාසැල් පද්ධතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම**

2016 වර්ෂයේදී ජනාධිපතිතුමා වෙත පිළිගැන්වූ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබද ජාතික ප්‍රතිපත්තිය සඳහා වූ යෝජනා මාලාවේ පාසල් පද්ධතිය පිළිබඳ පරිච්ඡේදයක් නොමැති වීම හේතුවෙන් මෙරට පාසල් පද්ධතිය පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බවට හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය පිළිබඳව විමසා බැලීමේදී ගැටළු රාශියක් පවතින බව අවබෝධ වේ. පාසල් පද්ධතියේ පවතින ප්‍රධාන ගැටළුව ලෙස සම්පත් විෂමතාව පෙන්වා දිය හැක. මීට අමතරව, නාගරික ප්‍රදේශවල සුපිරි පාසල් ව්‍යාප්තවීම, එහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල ළමුන් විශාල පිරිසක් නගරයේ පාසල් කරා ඇදී යාම වැනි ගැටළුකාරී තත්වයන් උදා වී ඇත. මෙම තත්වයට හේතු ලෙස මධ්‍ය මහා විද්‍යාල

සංකල්පය ක්‍රියාත්මක නොවීම හා ග්‍රාමීය දරුවන් වෙත ලැබිය යුතු ද්විතීයික අධ්‍යාපන පහසුකම් නිසියාකාරව දියුණු වී නොතිබීම පෙන්වා දිය හැක.

එහෙයින්, මෙරට පාසල් පද්ධතිය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සබරගමු පළාත් පාසල් පද්ධතිය සමාලෝචනය කිරීමට නියමිතය. මෙම අධ්‍යයනය වෙනුවෙන් සබරගමු පළාත් ප්‍රධාන ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සමඟ මූලික සාකච්ඡාවක් පැවැත්වීය. ඒ අනුව, සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් මෙම සමීක්ෂණය සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කිරීම සඳහා එකඟ වී ඇත. සබරගමුව පළාතේ විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ දෙමාපියන්ගෙන් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කිරීමට අපේක්ෂා කෙරේ.

තව ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ ක්‍රියාවලියේ තවත් එක් පියවරක් ලෙස 2018 වසරේ නොවැම්බර් මස මුල් සතියේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමග වැඩමුළුවක් පවත්වන ලදී.

### 1.3 පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

පෙර පාසැල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ඇති බව හඳුනා ගෙන ඇති අතර ඒ පිළිබඳ ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම සඳහා අදාල සියලු පාර්ශවකරුවන් සමඟ සංවාදයක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, පෙර පාසල් කටයුතු සම්බන්ධ පලාත් නිළධාරීන්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ නියෝජිතයින් සම්බන්ධ කර ගනිමින් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී 2018.10.12 දින වැඩමුළුවක් පවත්වන ලදී.

මීට අමතරව, යෝජිත පෙර පාසැල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සැකසීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර 2018 වසරේ නොවැම්බර් මස මේ සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් පවත්වා ඇත.

### 1.4 STEM Education සම්බන්ධ ප්‍රතිපත්තිය සකස් කිරීමට දායකවීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත STEM ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ අරමුණින් වැඩමුළුවක් 2018 ඔක්තෝබර් 5 දින සිට 7 දක්වා මීගමුවේදී පවත්වන ලදී. මේ සඳහා මූල්‍යමය දායකත්වය සපයන ලද්දේ අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි.

සාමාජිකයින් 38 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විසින් සකස් කරන ලද "STEM අධ්‍යාපන උපාය මාර්ගය" මැයෙන් වූ යෝජනාවලිය වැඩමුළුවේදී සාකච්ඡා විය.

එම යෝජනාවලියෙහි අන්තර්ගත කරුණු දීර්ඝ ලෙස ජාතික අධ්‍යාපන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග සාකච්ඡා කළ යුතු බව තීරණය කරන ලදී.

### 1.5 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සඳහා දායකත්වය ලබාදීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා සෞඛ්‍යය විෂයය අනිවාර්ය විෂයයක් ලෙස හඳුන්වා දීමට අදාළව ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව නිර්දේශ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, අධ්‍යාපන අමාත්‍යාංශයටත්, අමාත්‍ය මණ්ඩල ලේකම්ටත් ඉදිරිපත් කරන ලදී.

## 2. උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

### 2.1 උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුනාගෙන ඒ සඳහා වඩාත් ඵලදායී ස්ථිරසාර දිශානතීන් අනුව පුළුල් ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීම අරමුණු කොට උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීමට මුලපුරා ඇත.

ඉහත අරමුණු පෙරදැරිකොටගෙන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ප්‍රතිපත්ති සමාලෝචනය, පවතින ගැටළු හා ඉදිරි ප්‍රවනතා හඳුනාගැනීමේ අධ්‍යනයක් සඳහා පර්යේෂණ කණ්ඩායම් අටක් පත් කරන ලදී. හඳුනාගන්නා ලද පර්යේෂණ අධ්‍යයන මාතෘකා 08ක් සඳහා යොමු කිරීමේ අනුදේශයන් (**TOR)** සකස් කරන ලදී. ඒවා නම්, (i) පාලනය, මූල්‍යය හා සම්පත් කළමනාකරණය (ii) පශ්චාද් උපාධි අධ්‍යාපන හා පර්යේෂණ (iii) ශිෂ්‍ය සුභසාධනය හා විනය (iv) වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය (v) උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත් වීම හා ඉල්ලුම ඇති නව විෂයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනාගැනීම (vi) පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය සහ රාජ්‍යය හා පෞද්ගලික අංශයේ සම්බන්ධතාවය (vii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය හා (viii) රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය.

ඉහත සියලුම අධ්‍යයන වාර්තාවන්හි කෙටුම්පත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ලැබී ඇත. අතුරු අධ්‍යයන වාර්තාවන් (**Interim Reports)** සමාලෝචනය කිරීම සඳහා 2018 අගෝස්තු මස 03 හා 13 දිනයන්හිදී වැඩමුළු දෙකක් පවත්වන ලදී

කෙටුම්පත් කරන ලද අවසන් අධ්‍යයන වාර්තාවන් සමාලෝචනය සඳහා වැඩමුළු දෙකක් 2018 නොවැම්බර් මස 26 හා දෙසැම්බර් මස 17 යන දිනයන්හිදී පවත්වන ලදී.

## 3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

### 3.1 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ දැනට පවත්නා ප්‍රතිපත්ති රාමුව 2009 දී ප්‍රකාශයට පත් කරන ලද්දකි. පසුගිය දශකය තුළ මෙරට හා ජාත්‍යන්තරය තුළ සිදු වූ සමාජ , ආර්ථික හා තාක්ෂණික වර්ධනය හේතුවෙන් හා වැඩ ලෝකයේ අවශ්‍යතාවයන් සහතික කරනු වස් දැනට පවතින ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම හා නව ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම අවශ්‍ය වී ඇත.

ඒ අනුව, 2017 වර්ෂයේ දී ආරම්භක වැඩමුළුවක් පවත්වමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම ආරම්භ කරන ලදී. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා කණ්ඩායම් 09ක් පත්කළ අතර අදාළ වාර්තා 2018 ජුලි මස පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වැඩමුළුවක දී ඉදිරිපත් කරන ලදී. සංස්කරණය කරන ලද අවසන් වාර්තා සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය ලබාගෙන ඇත.

යෝජිත ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමේදී පහත සඳහන් ප්‍රවේශයන් 09ක් පිළිබඳව අවධානය යොමුකර ඇත. ඒවා නම්, (i)කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට ප්‍රවේශවීම වර්ධනය කිරීම. (ii) භෞතික, මූල්‍ය සහ මානව සම්පත්වල උපරිම භාවිතය. (iii) පාඨමාලා අතිපිහිතවීම (Overlap) අවම කිරීමට පුහුණු වැඩසටහන් පරිමේයකරණය කිරීම.(iv) කාර්මික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන වැඩසටහන් වල අදාළත්වය හා ගුණාත්මකභාවය.(v)කර්මාන්තය, සේව්‍යයන්, සේවකයන් සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව අතර අන්තර් සබඳතාවය. (vi)සාමාන්‍ය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සමඟ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුවෙහි අන්තර් සම්බන්ධතාවය. (vii) කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන සඳහා අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ වෘත්තීය සංවර්ධනය.(viii) අවදානම් තත්වයට මුහුණ පෑ සහ ප්‍රතිලාභ නොලබන පිරිස් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව සඳහා ප්‍රවේශ වීම. (ix) තොරතුරු එක්රැස් කිරීම, බෙදා හැරීම සහ වෘත්තීය මාර්ගෝපදේශනය.

පරිච්ඡේද නවයකින් යුත් ප්‍රතිපත්ති ප්‍රකාශය සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය අනුව සංස්කරණයන් සිදුකර 2018.10.25 වන දින පැවැති ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණි.
සංස්කරණය කරන ලද හා සාරාංශගත කරන ලද සියළුම වාර්තා සිංහල හා දෙමල භාෂාවන්ට පරිවර්ථනය කිරීමේ ක්‍රියාවලියෙහි පවතී.

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉංග්‍රීසි පිටපත 2018 වර්ෂයේ දෙසැම්බර් මස මුද්‍රණය කරන ලදී.

## 4. ප්‍රතිපත්ති සම්බන්ධ අධ්‍යයන

ඉහත කාර්යයන් වලට අමතරව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් විශේෂ කාර්යයක් ලෙස සලකා "සිංහල අක්ෂර ලේඛන හ භෂා ප්‍රයෝගවිධි පිළිබඳ ප්‍රමිතිය" සම්බන්ධ වාර්තාවක් ජනාධිපතිතුමා වෙත බාරදීමට තීරණය කර ඇත.

ඒ අනුව, ඉහත සඳහන් ග්‍රන්ථය මහාචාර්ය විමල් ජී. බලගල්ලේ, මහාචාර්ය ජේ. බී. දිසානායක, මහාචාර්ය අශෝක ප්‍රේමරත්න සහ මහාචාර්ය රත්නසිරි අරංගල යන මහත්වරු විසින් සකස් කරන ලදී.

විද්වත් මණ්ඩලය විසින් සකස් කරන ලද අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත භාර දී ඇත.

2018.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | _ |
| ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති නිලධාරී | 5 | 2 | 3 |
| නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම් | 1 | 1 | _ |
| ගණකාධිකාරී | 1 | _ | 1 |
| ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 4 | 2 | 2 |
| පරිපාලන නිලධාරී | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (මුදල්) | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 4 | 3 | 1 |
| වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 1 | 1 | _ |
| සංවර්ධන නිලධාරීන් | 4 | _ | 4 |
| කළමනාකරණ සහකාර | 10 | 7 | 3 |
| රියදුරු | 6 | 6 | _ |
| ආරක්ෂක නියාමක | 2 | 2 | _ |
| කාර්යාල සහයක | 4 | 4 | _ |
| **මුළු** | **45** | **31** | **14** |

**මානව සම්පත් සංවර්ධනය**

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතාවයෙන් හෙබි කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ. ඒ සඳහා පවත්නා සීමිත පුරප්පාඩු සියල්ල පිරවීමට ද මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මානව සම්පත් සංවර්ධනය සඳහා සකස් කරන ලද සැලැස්මකට අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා හඳුනාගත් අවශ්‍යතාවයන් අනුව ධාරිතා සංවර්ධනය/පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම අත්‍යවශ්‍යවේ.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය / පුහුණුව පිළිබඳ තොරතුරු - 2018**

| | වැඩසටහනෙහි නම | සහභාගී වූ නිලධාරීන්ගේ නම | තනතුර | කාලය |
|---|---|---|---|---|
| 1. | වත්කම් කළමනාකරණය | එච්.එන්.එන්. ගුණසේකර මහත්මිය | ලේකම් | 2018 පෙබරවාරි 26 |
| 2. | දේපළ /උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම | එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | 2018 පෙබරවාරි 28 |
| 3. | අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලාව 2018- පර්යේෂණ සාහිත්‍ය විමර්ෂණය | ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>ඩබ්.ඩී.ඒ. කේ. දමයන්ති මහත්මිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති) | 2018 ජුනි 08,09,10 |
| 4. | රියදුරන් සහ කාර්යාල සහයකයන් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි | එස්.ඒ.සී. ප්‍රියන්ජිත් මහතා | රියදුරු | 2018 ජුනි 07,08 |
| 5. | ලංසු ලියවිලි සැකසීම | එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | 2018 මැයි 31 |
| 6. | ලංසු ඇගයීම | ඩබ්.ඩී.ඒ. කේ. දමයන්ති මහත්මිය | වැඩසටහන් නිලධාරී(ප්‍රතිපත්ති) | 2018 ජුනි 14 |
| 7. | Introduction to SPSS for statistical Analysis | ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 2018 ජුනි 03,10,17,24 |
| 8. | පර්යේෂණ ක්‍රම වේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව.- 2018 | එස්.ඒ.ඩී. ද සිල්වා මහතා<br>ඩී.ඩී.සී. කළුබෝවිල මහතා<br>ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>ඩබ්.ඩී.ඒ. කේ. දමයන්ති මහත්මිය<br>සී.ආර්. මයුරන් මහතා<br>ඩබ්.ඒ.ඩී.ටී. ජයසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති) | ලියාපදිංචිය 2018 ජුනි 18 |
| 9. | Advanced Excel පිළිබඳ වැඩමුළුව | ජී.එල්. නිමේෂා මහත්මිය | කළමනාකරණ සහකාර | 2018 අගෝස්තු 01,08,15 |
| 10. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2017 | එම්.ඒ. දිහාරා ධනංජනී | කළමනාකරණ සහකාර | 2018 අගෝස්තු 02,03 |
| 11. | නව බදු නීතිය | එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | 2018 අගෝස්තු 14 |
| 12. | තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම | එස්.එම්.ඒ ද අල්විස් මහතා<br>එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | නියෝජ්‍ය ලේකම්<br>පරිපාලන නිලධාරී | 2018 සැප්තැම්බර් 27,28 |

| | | | | |
|---|---|---|---|---|
| 13. | පරිපාලන නිලධාරින් සතු වගකීම හා කාර්ය භාරය | එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | 2018 සැප්තැම්බර් 20,21,22 |
| 14. | සේවය නතර කිරීම | එස්.එම්.ඒ ද අල්විස් මහතා | නියෝජ්‍ය ලේකම් | 2018 සැප්තැම්බර් 04 |
| 15. | දත්ත විශ්ලේෂණය | ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>ඩබ්.ඒ.ඩී.ටී. ජයසිංහ මහත්මිය<br>එච්. ඕ.සී. ගුණසේකර මෙනවිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී(තොරතුරු)<br>වැඩසටහන් නිලධාරී(ප්‍රතිපත්ති) | 2018 සැප්තැම්බර් 30 සිට (මාස 04 ) |
| 16. | රියදුරන් හා කාර්යාල සහයකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි | පී.ඒ. ගුණතුංග මහතා<br>ආර්.ඒ.ආර්. චන්දිමාල් මහතා | රියදුරු<br>කාර්යාල කාර්ය සහයක | 2018 ඔක්තෝබර් 22, 23 |
| 17. | ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය - උසස් ජාතික ඩිප්ලෝමාව | ඩබ්.ඒ.ආර්.එන්. කුමාරසිංහ මිය | වැඩසටහන් නිලධාරී( මුදල්) | 2017/2018 |
| 18. | International Study Tour for Capacity Building of Program Officers of National Education Commission | එන්. පී. ජේ හේවගේ මහතා<br>ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>ඩබ්.ඩී.ඒ. කේ. දමයන්ති මහත්මිය<br>මයුරන් ක්‍රිස්ට් මහතා<br>ඩබ්.ඒ.ඩී.ටී. ජයසිංහ මහත්මිය<br>එච්. ඕ.සී. ගුණසේකර මෙනවිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී(ප්‍රතිපත්ති)<br>වැඩසටහන් නිලධාරී(ප්‍රතිපත්ති)<br>වැඩසටහන් නිලධාරී(තොරතුරු)<br>වැඩසටහන් නිලධාරී(ප්‍රතිපත්ති) | 2018 නොවැම්බර් 26 දින සිට දෙසැම්බර් 02 දින දක්වා |

## අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2018

**National Education Commission**

**Financial Progress Report as at 31st December 2018**

| Object Code | Description | Provision Rs. | FR66/69 Transfers & Supplementary Rs | Net Provision Rs. | Expenditure Rs. | Expenditure as Percentage (%) |
|---|---|---|---|---|---|---|
| | **Recurrent Expenditure** | **40,202,000** | **-192,000** | **40,010,000** | **38,473,542** | **96.16** |
| | **Personal Emoluments** | **23,750,000** | | **23,750,000** | **22,531,873** | **94.87** |
| 1001 | Salaries and Wages | 17,000,000 | | 17,000,000 | 16,871,023 | 99.24 |
| 1002 | Overtime and Holiday Payments | 750,000 | | 750,000 | 676,070 | 90.14 |
| 1003 | Other Allowances | 6,000,000 | | 6,000,000 | 4,984,780 | 83.08 |
| | **Travelling Expenses** | **600,000** | | **205,000** | **193,986** | **94.63** |
| 1101 | Domestic | 100,000 | 53,000 | 153,000 | 142,154 | 92.91 |
| 1102 | Foreign | 500,000 | -448,000 | 52,000 | 51,832 | 99.68 |
| | **Supplies** | **1,900,000** | | **2,007,000** | **1,993,294** | **99.32** |
| 1201 | Stationery and Office Requisites | 300,000 | | 300,000 | 299,616 | 99.87 |
| 1202 | Fuel | 1,350,000 | 149,000 | 1,499,000 | 1,487,124 | 99.21 |
| 1203 | Diets and Uniforms | 150,000 | -42,000 | 108,000 | 107,399 | 99.44 |
| 1205 | Other | 100,000 | | 100,000 | 99,155 | 99.16 |
| | **Maintenance Expenditure** | **1,900,000** | | **1,794,000** | **1,758,428** | **98.02** |
| 1301 | Vehicles | 1,300,000 | | 1,300,000 | 1,293,696 | 99.52 |
| 1302 | Plant and Machinery | 500,000 | -56,000 | 444,000 | 429,640 | 96.77 |
| 1303 | Buildings and Structures | 100,000 | -50,000 | 50,000 | 35,092 | 70.18 |
| | **Services** | **11,000,000** | | **11,174,000** | **10,937,724** | **97.89** |
| 1402 | Postal & Communication | 1,100,000 | 130,000 | 1,230,000 | 1,196,129 | 97.25 |
| 1403 | Electricity & Water | 900,000 | | 900,000 | 809,762 | 89.97 |
| 1404 | Rents & Local Taxes | 7,200,000 | -769,900 | 6,430,100 | 6,430,100 | 100.00 |
| 1409 | Other | 1,800,000 | 813,900 | 2,613,900 | 2,501,734 | 95.71 |
| | **Transfers** | **1,052,000** | | **1,080,000** | **1,058,237** | **97.98** |
| 1502 | Retirements Benefits | 1,052,000 | | 1,052,000 | 1,051,600 | 99.96 |
| 1506 | Property Loan Interest to Public Servant | -- | 28,000 | 28,000 | 6,637 | 23.70 |
| | **Capital Expenditure** | **9,250,000** | **220,000** | **9,470,000** | **7,990,910** | **84.38** |
| | **Acquisition of Capital Assets** | **1,320,000** | | **1,320,000** | **802,772** | **60.82** |
| 2102 | Furniture & Office Equipment | 750,000 | | 750,000 | 259,475 | 34.60 |
| 2103 | Plant, Machinery & Equipment | 570,000 | | 570,000 | 543,297 | 95.32 |
| | **Capacity Building** | **1,750,000** | | **1,970,000** | **1,945,380** | **98.75** |
| 2401 | Staff Training | 1,750,000 | 220,000 | 1,970,000 | 1,945,380 | 98.75 |
| | **Research Programmes on Education** | **6,180,000** | | **6,180,000** | **5,242,758** | **84.83** |
| 2507-1 | Research and Development | 980,000 | | 980,000 | 586,113 | 59.81 |
| 2507-2 | Formulation of Policy Proposals on University Education-Research and Development | 5,200,000 | | 5,200,000 | 4,656,645 | 89.55 |
| | **Total** | **49,452,000** | **28,000** | **49,480,000** | **46,464,452** | **93.91** |

**ඇමුණුම I**

**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2018**

| විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|
| මුද්‍රණ යන්ත්‍ර | 4 | 47,600.00 |
| රැහැන් රහිත මාධ්‍ය හසුරුවනය | 1 | 4,900.00 |
| පුටු (අඩු උස) | 8 | 63,900.00 |
| පොත් අල්මාරි | 1 | 20,340.00 |
| ලිපිකරු මේසය | 2 | 25,018.25 |
| වායු සමීකරණ යන්ත්‍ර | 2 | 490,796.53 |
| ඇඹිලි සලකුණු යන්ත්‍ර | 1 | 54,050.00 |
| ශබ්ද පද්ධතිය | 1 | 94,557.16 |
| **එකතුව** | | **802,771.94** |

**ඇමුණුම II**

## මූල්‍ය ප්‍රකාශය - 2018

ඒසීජ්-8

**2018.12.31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීජ්-6 | 43,749,643 | 42,946,871 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීජ්-5/5(ඒ) | 2,346,589 | 2,367,694 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීජ්-3 | 1,162,384 | 70,625 |
| **මුළු වත්කම්** | | **47,258,616** | **45,385,190** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 2,309,039 | 2,337,694 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 43,749,643 | 42,946,871 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීජ්-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීජ්-4 | 37,550 | 30,000 |
| අග්‍රිම ශේෂය | ඒසීජ්-3 | 1,162,384 | 70,625 |
| **මුළු වගකීම්** | | **47,258,616** | **45,385,190** |

පිටු අංක 5 සිට 48 දක්වා ඒසීජ් 1 සිට ඒසීජ් 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 53 සිට 60 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2019/2/27
මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

.....................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :
2019.02.27
එච්. පී. අප්සරා කල්දේරා
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක 126, නාවල පාර, නුගේගොඩ.

.....................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එස්. එම්. ආරියරත්න ද අල්විස්
නියෝජ්‍ය ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.
දිනය :

**ඇමුණුම III**

**කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු**

2017.09.07 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද හත්වන කොමිෂන් සභාව සිය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2017 ඔක්තෝම්බර් මස19 වන දින පවත්වන ලදී.

**කොමිෂන් සභාවේ සාමාජිකත්වය:**

| | |
|---|---|
| මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර මහතා | සභාපති |
| ආචාර්ය ජී.බී. ගුණවර්ධන මහතා | උප සභාපති (ප්‍රතිපත්ති) |
| ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා | උප සභාපති (සැලසුම්) |
| **නිල බලයෙන් පත්වන සාමාජිකයින්** | |
| මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා | සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| රජිව විජේසිංහ මහතා (2018.03.14 දින දක්වා)<br>සුධර්මා කරුණාරත්න මිය (2018.05.09 දින සිට)<br>මහාචාර්ය දයන්ත විජේසේකර මහතා (2018.07.11 දින සිට මේ දක්වා) | සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| මහාචාර්ය ආර්.යූ. හල්වතුර මහතා | අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත |
| ගීතා කේ. විමලවීර මිය (2018.07.11 දක්වා)<br>ඒ.එන්. හපුගල මහතා (2018.08.26 දින සිට මේ දක්වා) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත |
| එච්.ටී. කමල් පත්මසිරි මහතා | ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| **වෙනත් සාමාජිකයින්** | |
| පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක ස්වාමීන්වහන්සේ | |
| මහාචාර්ය කේ. කන්දසාමි මහතා | |
| මහාචාර්ය එම්. ඒ. නුහුමාන් මහතා | |
| මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ මහතා | |
| ආචාර්ය එස්. බී. ඒකනායක මහතා | |
| ආචාර්ය මල්ලිකා කරුණාරත්න මිය | |
| වී. බී. පී.කේ. වීරසිංහ මිය | |

**ඇමුණුම IV**

## විගණකාධිපති වාර්තාව - 2018

